RECEIVED
08 DEC 2015
Faculty of Graduate Studies
University of Kelaniya

# කාලීන කෘෂි ගැටලු විසඳීමෙහි ලා ජාතික පුවත්පත්වල භූමිකාව

(2011 වර්ෂයේ තෝරාගත් ජාතික පුවත්පත් දෙකක් ඇසුරෙනි)

ජ.ඩබ්ලිව්.එම්. ගමගේ

FGS/M/MSSc/2007/07

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1180 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීයවිද්‍යා පීඨයේ ජනසන්නිවේදනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2013 දෙසැම්බර්

# නිබන්ධ සාරාංශය

ශ්‍රී ලාංකේය කෘෂි ක්ෂේත්‍රයේ කාලීන ව මතු වන කෘෂි ගැටලු බොහෝ වුව ද ඒ පිළිබඳව ජාතික පුවත්පත්වල අවධානය ප්‍රමාණවත් නොවේ. මේ අනුව වත්මන් ජාතික පුවත්පත් කෘෂි ක්ෂේත්‍රය ආවරණය කරන ආකාරය, සංවර්ධනය සඳහා එහි බලපෑම, ඒ කෙරෙහි තියැදි ජනගහනය දක්වන සවිඥානිකත්වය විමසීම මෙම අධ්‍යයනයේ අරමුණයි. සාහිත්‍ය විමර්ශනය ඔස්සේ මූලික තොරතුරු එක්රැස් කළ අතර දිස්ත්‍රික්ක 6 කින් ගොවීන් 60 ක් හා කෘෂි නිලධාරීන් 30 ක් තියැදිය වශයෙන් ගෙන ප්‍රශ්නාවලි බෙදාහැරීමෙන් ක්ෂේත්‍රයේ දී දත්ත එක්රැස් කෙරිණි. 2011 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු යන තෝරාගත් මාස තුනක දිනමිණ හා ලංකාදීප යන ජාතික පුවත්පත්වල කෘෂි තොරතුරු සම්බන්ධ පළ වූ ලිපි විශ්ලේෂණය කරමින් අන්තර්ගත විශ්ලේෂණයක් ද සිදු කෙරිණි.

කෘෂි නිලධාරීන් කෘෂි විද්‍යාව පිළිබඳ දැනුම අලුත් කරගැනීම සඳහා පුවත්පත් කියවීම අධ්‍යයනය සම්බන්ධ එක් විශේෂත්වයකි. කෘෂිකාර්මික ලිපි සඳහා අඩු ප්‍රමුඛතාවයක් දීම, එහිදී ද රජයේ කෘෂි වැඩපිළිවෙල සඳහා ප්‍රමුඛතාවය දීම, ජනමාධ්‍යවේදියාගේ කෘෂි දැනුම ප්‍රමාණවත් නො වීම යනාදිය පුවත්පත්වල කෘෂි ලිපි පළ කිරීම සම්බන්ධයෙන් හඳුනාගත් දුර්වලතාවයන් විය. සමස්තයක් වශයෙන් ගොවීන් හා මාධ්‍යවේදීන් අතර ඍණාත්මක සබඳතාවයක් පවතී. පුවත්පත් දෙකෙ හි ම කෘෂිකර්මාන්තයට අදාළ සංවර්ධනාත්මක සිරස්තල හෝ කතුවැකි පළ නොවිණි. මූලාශ්‍ර භාවිතය අතින් පුවත්පත් දෙක ම දුර්වල තත්ත්වයක පසු වේ. පුවත්පත් ද්විත්වය ම ගොවි සමාජයේ ගැටළු ආවරණය කිරීම සඳහා ගොවි ප්‍රජාව වැදගත් මූලාශ්‍රයක් ලෙස නො සලකයි. පුවත්පත් දෙක ම සම්පත් දායකයින් සම්බන්ධ කරගෙන ඇත්තේ අවම වශයෙනි. තියැදියේ විශ්වාසය දිනාගැනීමට දිනමිණ පුවත්පත සාපේක්ෂ ව අසමත් වී ඇත. බහුතරය ලංකාදීප පුවත්පත පරිශීලනය සඳහා ප්‍රමුඛතාවය දී තිබුණි.

මීට යෝජිතව සෑම මාධ්‍ය ආයතනයක ම කෘෂි මාධ්‍ය ඒකකයක් පිහිටුවීම, කෘෂි සන්නිවේදනය විෂයයක් ලෙස සංවර්ධනය කිරීම, කෘෂි පුවත් අලෙවි කිරීම, කෘෂි සමාජය තුළ අන්තර් පුද්ගල සන්නිවේදන සම්බන්ධතා වර්ධනය කරනු පිණිස මාධ්‍ය ක්‍රියාකාරකම් දියත් කිරීම, කෘෂි අංශයේ නිලධාරීන් කෘෂි මාධ්‍යවේදීන් ලෙස ඉදිරියට ගෙන ඒම, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් පිළබඳ වැඩි අවධානයක් යොමු කරමින් පහසුකම් ලබාදෙමින් කෘෂි සන්නිවේදනය දියුණු කිරීම යන්න ඉදිරිපත් කෙරේ.

**මුඛ්‍ය පද**- කෘෂි සන්නිවේදනය, කාලීන කෘෂි ගැටළු, ජාතික පුවත්පත්, සවිඥානිකත්වය, අන්තර් පුද්ගල සන්නිවේදනය

# Abstract

e main objective of this research was to identify the role of national newspapers in addressing current issues related to agricultural sector in Sri Lanka. Even though there are many timely in agricultural sector national newspapers of the country had not be able to given the iate priority in reporting those issues. Therefore this study analyzed the current situation culture related newspaper articles and its influence on development communication and ousness of agriculture related officials and farmers on this news items. Secondary data collected using literature review and primary data was collected from 30 agricultural officers 60 farmers representing six districts in 2011 by using questionnaire survey. Content analysis done by using agriculture related articles published in *Dinamina* and *Lankadeepa* wspapers at same time period.

rvey results found that agricultural officers updated their knowledge on agriculture related current issues prevailed in the country by reading newspaper articles. Daily publishing newspapers has been given least priority in reporting agriculture related news events. Both studied newspapers did not use proper headline or editorial reviews to cover the agricultural topics. There was a criticism that national newspapers publish news items to cater the government need rather disseminating information to the common public based on the necessity. Because of the lack of knowledge on agriculture, sometimes journalists were not able to address the issue properly and write the column in understandable manner. Both farmers and officers prefer *Lankadeepa* as more credible source than *Dinamina* to gain awareness on news events.

The study suggests to establishing agricultural communication unit in all the media stations, mplementing professional and higher education programs related to agricultural communication mprove the knowledge of journalists, encouraging agricultural news marketing, development interpersonal communication concept among whole the agrarian sector and the media luding government and non government, motivating agricultural officers as agricultural ommunicators and provide benefits and relevant facilities specially for provincial reporters to ncourage the agricultural communication.



**ey words**- agricultural communication, current issues related to agricultural sector, national wspapers, consciousness, interpersonal communication